# කෝට්ටේ යුගයේ විශ්‍රාන්ති වර්ණනා

කේ.ඩබ්.ඩී. සඳමාලි

සන්දේශය යන්න වචනාර්ත වශයෙන් ගත් කළ ''මැනවින් ප්‍රකාශිත දෙය '' බඳු අරුතක් පල කරතත් , සමුදායාර්ථ වශයෙන් එමගින් '' නිශ්චිත පණිවිඩයක් ගැබ් කරගත් ලියවිල්ලක් '' ම ගම්‍යමාන කෙරෙතැයි සිතිය හැක . කෝට්ටේ යුගයේ රචිත ගිරා සන්දේශයෙ හි කතෘ අඥතය. ඇතැමෙකු බුදු ගුණ අලංකාරයෙහිත් මෙහිත් ඇතැම් පද්‍යයක සාම්‍යය හුවා දක්වමින් වීදගම මෛත්‍රී හිමියන්ටම මෙහි කතෘත්වය පවරන්නට උත්සාහ ගනී . මේ ගිරා සන්දේශයෙ හි මතු නොව, සමස්ත සිංහල කාව්‍යයෙහිම වුව අති මනරම් පද මාලාවකින් රචනා කොට ඇත. විශ්‍රාන්තිය ගිරා සන්දේශයෙහි විවිධ වැනුම් ඔස්සේ විමසා බැලීමකි මේ.
කෙ ළ නා ලිය පියොවුරු බිතු ගැසෙමිනි , විදුනා රළ රොන් වැදැ-වැදැ වෙසෙසිනි , සොබ නා සොබා වුවනත නඳ විලසිනි , රඳ නා අම කිරණින් පිරි සඳ වැනි . . . කියමින් වෙන වෙන වාසී පෑ බල , ඉඳිමින් දිය තුළැ නාපෙනී බෝ කල , පෙනෙමින් තැනැ තැනැ විදුලිය සේ දුල , ගසමින් කෙළැ කෙළැ යති දිය කෝකිල . . . විලසින් දිය කෙළැ කෙළැ යෙත නොහැලී , වෙසෙසින් නැගි රළ රොන් ගඟ ඉපිලී , පහසින් තම එක සරි යැයි එකලී , සතොසින් ලොමු'දහ ගත් සිරි කියෙලී . . . සෙදනා ලොවිනා ළඳුනා ලෙසිනා , රළිනා ලෙළෙනා සොබනා ගතිනා , නදනා ගඟ නා කෙළනා ලියනා , දකිනා මතිනා හදනා තොසිනා . . . ඉසිරි දිසි දිය දහරින් අඹරා , සසිරි හුණු ඉඳු සැවු සිය , පතරා
විසිරි ගිය ගඟ ලතු කොකුමඟරා , අසිරි සිතුවම් දැක්වී එතෙරා . . . සැරද කිර රද සර , නන්වන් රුවන් රුවන් , යහකුරු මියුරු තෙපලෙන් , සව් ලෙව් හදන් හදනා . . . වන සර දැක තම සිතැබිය සලසා , ගන ගන ගැබැ ලෙළ දෙන විඳු විලසා , වන ගැබැ ඔබිනොබ පැන යන නොලසා , තැනැ තැනැ මුවරළ දැක යව සතොසා . . . සොබනා තුනු රුසිරින් දන මන් බැද , ලෙළෙනා නිල'ඹර රන් දද මෙන් සොද , රළිනා ගැලැ' පිලෙමින් සතොසින් , කෙළනා සදැ මෙලෙසින් අගනන් . . . ඉසිරි දිසි දිය දහරින් අඹරා , සසිරි හුණු ඉඳු සැවු සිය පතරා , විසිරි ගිය ගඟ ලතු කොකුමගරා , අසිරි සිතුවම් දැක්වී එතරා . . . ලක කොමලග ෂමනොල ගිරි හිසින් ගොතා , හළ මන රග මලිගිය හිසින් මල් දමින් යුතා , වරලසා රග පෙණ වැළ හැලි සියෙන් ඉතා , දිළි කළු ගඟ ළග වැදැ හරු ගිමන් ගතා . . . ගිමන නිවන සිසිලස තරග රොන් වැද බමන බඹර රැවු සහ මල් සුවඳ හැද , හමන සිනිඳු මද නල පහස විඳැ විඳැ , තමන නදන විසිතුරු තුරු සිරෙකැ හිදැ . . .

නා ලොවින් ආ ලියන් ලෙසින් කාන්තාවන් ගඟෙහි නහමින් කෙළන ආකාරය දකිනවුන්ගේ හද සතුටින් නැහැවේ. ක්‍රීඩාවේ යෙදෙන ස්ත්‍රීන්ගේ පියයුරු පෙදෙසේ ගැසී විසි වන දිය රැළිවල ජලබිඳු වැදිවැදී විශේෂයෙන් ශෝභමාන වූ මුහුණු සංතුෂ්ටිකර ස්වභාවයෙන් අමෘත රශ්මියෙන් රංජිත වූ පූර්ණ චන්ද්‍රයා වැනිය නොයෙකුත් වහසී බස් පවසමින්, හපන්කම් දක්වා බොහෝ වේලා වතුර යට සැඟවී සිටිමින් , විදුලිය කොටනවා සේ තන්හි තන්හි පෙනෙමින් මේ ගැහැණු දිය කොකිල ගසමින් ක්‍රීඩා කරති. . . . ස්ත්‍රීන් නානැවතී ජල ක්‍රීඩා කරද්දී අමුතුවෙන් නැගුණ රැළිවල ජල බින්දු ඉල්පී ගඟ තමා ස්පර්ශයෙන් එක සමාන යැ යි සතුටින් රෝමෝද්ගමනය වූ ආකාරයෙන් දැක්වීය. . . . , ලියන් ශෝභන රූපශ්‍රීයෙන් ජනයාගේ සිත් බඳිමින් , නිල් අහසේ ලෙලදෙන රන් දද මෙන් සතුටින් බැස , රැල්ලෙන් ගිලෙමින් මතු වෙමින් ක්‍රීඩා කරන කල්හී ... ගංගාව , අහසේ දිස් වුණු ජල ධාරාවන්ගෙන් වැටුණු මහත් දේදුණු සමූහයෙන් සශ්‍රීක , විසිරුණු ලාක්ෂා කුංකුම අංගරාවෙන් ආශ්චර්යවත් චිත්‍රයක් පෙන්වීය . . . මේ ලියන් දෙස ගඟ දෙපස සිට බලා සිටිනා මිනිසුන්ගේ නෙත් කැලුම් , ඒ ලියන් තමන් තමන් වෙත ඇද ගන්නා වැන්න , ඒ ලණුයෙහි බැඳුනාක් මෙන් එතෙර මෙතෙර පිහිනනා අගනුන් ගිරවාගේ ගමනට සැඳු රන් පාලමක් මෙනඅ යි කීමෙන් , තමා මෙහි රැඳෙන්නේ ගමනක් යන අතරමග භව ගිරවාට මොහොතකට සිහිපත් කරන් වැන්න . . .
විශ්‍රාන්තිය ගිරා සන්දේශයෙන් උක්ත අයුරින් පෙන්වා දිය හැකිය .